ප්‍රවේශවිය හැක. එය ද මෙට්‍රෝ හෝ මොනො රේල් හෝ වැනි ආකෘතියක් අනුව නිර්මාණය කළ හැකිය. මහනුවර නගරය තුළ ගමනාගමනය සඳහා නවීන පොදු ප්‍රවාහන ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය. මේ පිළිබඳ කැන්ඩි සිටි සෙන්ටර් අධිපතිවරයා යෝජනා කර ඇති ක්‍රමවේදය කෙරෙහි අවධානය යොමුකිරීම ප්‍රයෝජනවත්ය. පල්ලෙකැලේ සහ අම්පිටිය යන දිසාවලින් පිවිසෙන රථවාහන වැව රවුමේ බෝගම්බර කෙළවර සිට ඉදිකළ හැකි උස්සාන මාර්ගයක් ඔස්සේ නව නුවරට සම්බන්ධ කළ හැකිය. ඒ සඳහා මහනුවර නගරයේ බිම් උස මනා පිටිවහලක් කරගත හැක. එමෙන්ම මහනුවර නගරය තුළ තිබෙන අතුරු මාර්ග වෙනුවට උස්සාන මාර්ග කිහිපයක් ද බිම් උස ප්‍රයෝජනයට ගෙන ඉතා පහසුවෙන් ඉදිකර ගැනීමෙන් නාගරිකයන්ට ප්‍රවාහන පහසුව සලසා දිය හැක.

නිදර්ශනයක් ලෙස හීරැස්සගල හන්දිය දෙපස බිම් උස අනුව උස්සාන අතුරු මාර්ගයක් ඉදිකර ගැනීමට තිබෙන පහසුව පෙන්වා දිය හැක. මහනුවර නව නගරය ගන්නෝරුවේ ඉදිකිරීම මගින් මහනුවර ප්‍රධාන මාර්ග සියල්ල සහ දුම්රිය මාර්ගය ඉහත සඳහන් කළ පරිදි එකම මාර්ග ජාලයකට සම්බන්ධ කළ හැකිය. කොළඹ නුවර අධිවේගී මාර්ගයට ගන්නොරුව ඔස්සේ පිවිසුමක් පවතින බැවින් නව නුවර නගරයට මනා පොදු ප්‍රවාහන පද්ධතියක් ලබාදිය හැකිය. මේ ඔස්සේ පැරණි නුවර නගරයට ඇතුළුවන රථවාහන සංඛ්‍යාව තුනී කරගත හැකි වන අතර නව නගරයේ සාප්පු, කාර්යාල යනාදි පහසුකම් නිර්මාණය වූ පසු පැරණි නුවර නගරය තවදුරටත් ගමනාගමනයට හා ජීවත්වීමට පහසු නගරයක් බවට පත්වේ.

ඉහත අහිතකර හේතු සහ ඵල සියල්ල ඉවත්කර ගැනීමට තිබෙන ඒකායන මාර්ගය වන්නේ මෙම නව නුවර නගරය ඉදිකිරීම සහ උස්සාන අතුරු මාර්ග ව්‍යාපෘති වේ. සුපුරුදු සංකල්ප හෝ චින්තනය ඔස්සේ සිතීම මෙම ව්‍යාපෘති සාක්ෂාත් කරගැනීමට බාධාවක් වන අතර ඉදිරි වසර සියයක් ප්‍රක්ෂේපණය වන පරිදි අනාගතවාදී දෘෂ්ටියකින් ඒ කෙරෙහි සිතා බැලිය යුතුය. ගන්නොරුව ගොවිපලෙන් දැනට ඉටුවන සේවයට වඩා වටිනා සේවයක් එය සුදුසු භූමියක අභිනවයෙන් ස්ථාපිත කිරීම මගින් සාක්ෂාත් කරගැනීමට සැලසුම් සකස් කළ යුතුය. මෙම නව නුවර ඉදිකිරීම දළදා මාලිගාවේ චිරස්ථිතිය උදෙසා ද මහනුවර ඓතිහාසික වටිනාකමින් යුත් අන් සියලූ අංග ලක්ෂණ සුරක්ෂා කරගැනීම උදෙසා ද හේතුභූත වේ. ඒ අනුව පැරණි මහනුවර අලංකාරවත්, තේජාන්විත හා නිස්කලංකවත් ඓතිහාසික මහනුවර ලෙස පවත්වා ගැනීමේ ඓතිහාසික වගකීම ඉටුකර ගත හැකි වනු ඇත. දැනටමත් බොහෝ අංග ලක්ෂණ විනාශ වී ගොස් ඇති මහනුවර නගරයෙහි ඓතිහාසික ශ්‍රී විභූතිය ප්‍රතිෂ්ඨාපනය කරගැනීමේ සංරක්ෂණ භාග්‍යය උදාකරගත හැකි වන්නේ මෙම නව මහනුවර ඉදිකිරීමෙන් පමණි. ජපානයේ නරා නගරය වසර හාරසියයක් පැරණි නගරයකි. එහි ඓතිහාසික ලක්ෂණ සංරක්ෂණය කරගනිමින් නව නරා නගරය ඉදිකරගෙන තිබෙන අත්දැකීම, නව මහනුවර නගරය ඉදිකර ගැනීමෙහිලා සැලසුම් ශිල්පීන්ට වෙසෙසින් ප්‍රයෝජනවත් වනු ඇත. එසේම ජපානයේ ඓතිහාසික ක්යෝතො නගරය ආරක්ෂාකර ගනිමින් නව ක්යෝතො නගරය ඉදිකර තිබෙන අයුරු අතිශය ආදර්ශමත් ය. නව මහනුවර නගරය ඉදිකිරීම කරණකොට ගෙන මහනුවර ඓතිහාසික නගරය සුරක්ෂිත වන බැවින් ද නවීන ගොවිපලක් ඉදිවන බැවින් ද සෞඛ්‍ය හා පාරිසරික ගැටලූ විසඳෙන බැවින් ද කිසිවෙකුටවත් මෙම ඒකාබද්ධ සංවර්ධන යෝජනාවට එරෙහි වීමට සාධාරණ හේතුවක් තිබිය නොහැකිය.

ravaya.lk

**Land for sale in PANADURA**

3 Plots of 10 Perch Each in respectable residential area. 500 meters to International schools, Banks, Supermarkets, and Government Hospital.

Approximately 1KM to Town and around 25km to Colombo. All utilities accessible including 4G. Clear deeds with legacy.

Contact
psldhamma@gmail.com
**Sujatha Perera +943837358 +94717072645**

**Land Sale in Sri Lanka**

**Ethul Kotte**

20 Perch bare land at Maligawa Road, Etul Kotte, 50m From Main Kotte - Nugegoda Road. Near Telecom, Post Office & Cargills Food City.

Contact: 0448756944

**IMMIGRATION LAW @**
Australian Immigration Law firm of the Sri Lankan Community

We are proud to have lead the way for others to follow...

**Professional Immigration Legal Services**
Legal Advice in simple to complex Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced Lawyers & Registered Migration Agents



**Susantha Katugampala**
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS

AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com



*We Deliver Results...*